අ:පො:ස (සා:පෙළ) විභාගය 20 20 දෙසැම්බර්

( 87) - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය ( නව නිර්දේශය)

පෙරහුරු පරීක්ෂණය 11 ශ්‍රේණිය

කාලය :- පැය තුනයි ( 03 )

නම:- ........................................ පංතිය:- ........................

## ( A ) – කොටස (බහුවරණ)

➤ ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න .

1) ජන මාධ්‍ය වර්ග කරන ලබන ප්‍රධාන කොටස් දෙක,

1) මුද්‍රිත මාධ්‍ය හා රූපමය මාධ්‍ය ලෙසය.
2) විද්‍යුත් මාධ්‍ය හා දෘශ්‍ය මාධ්‍ය ලෙසය.
3) මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය ලෙසය.
4) මුද්‍රිත මාධ්‍ය හා දෘශ්‍ය මාධ්‍ය ලෙසය.

2) මිනිසුන් සන්නිවේදනයේ යෙදීමේ අවශ්‍යතාව වඩාත් ඉස්මතු වී පෙනෙන්නේ

1) විවිධ අදහස් හුවමාරු කර ගැනීමට කටයුතු කරන අවස්ථාවේදීය.
2) පාලුව කාන්සිය මගහරිමින් සිටින අවස්ථාවේ දීය.
3) සමාජ අන්තර් ක්‍රියා මගින් චිත්තශක්තිය වර්ධනය කරන අවස්ථාවේදීය .
4) නිර්මාණාත්මක සිතුවිලි බිහි කරන අවස්ථාවේදීය..

3) කුඩා දරුවෙකු සතුන්ගේ පින්තූර සහිත පොතක් රැගෙන එහි වූ විස්තර හඳුන්වා දෙනු ලැබීය. මෙම අවස්ථාවේදී ප්‍රකට වී ඇති සන්නිවේදන ස්වරූපය වන්නේ,

1) වාචික - ලිඛිත 2) වාචික - දෘශ්‍ය 3) අවාචික - දෘශ්‍ය 4) අවාචික - වාචික

4) සන්නිවේදන ස්වරූපයක අවශ්‍යතාවය ඇති වනුයේ .

1) ග්‍රාහක මානසිකත්වය අනුවයි .
2) ග්‍රාහක අවශ්‍යතාවය අනුවයි .
3) ග්‍රාහකයාගේ ක්‍රියාකාරීත්වය අනුවය .
4) ග්‍රාහක - ග්‍රාහක අන්තර් වචනය.

5) කාර්යාලීය අභ්‍යන්තර සන්නිවේදනය සඳහා යොදාගත හැකි උපකරණයකි .

1) චලන රූප සහිත බෝඩ්.
2) බැනර් හා කටවුට්.
3) ෆැකස් යන්ත්‍රය .
4) පුවත් පත් .

6) පහත දක්වා ඇත්තේ DTP ක්‍රියාවලිය පිළිබඳ සිසුවකු ලියන ලද සාරාංශ සටහනක කොටසකි.

අත් පිටපත සැකසීම → A → B

මෙහි A හා B හිස්තැනට ගැලපෙන ක්‍රියාකාරකම

1) මෘදුකාංග භාවිතය හා යතුරු ලියනය.
2) බැඳුම් කිරීම හා ලැමිනේටින් කිරීම
3) රූප එකතු කිරීම හා මුද්‍රිත පිටපත ලබා ගැනීම.
4) අක්ෂර සංයෝජනය හා පිටු සැකසීම

7) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සම්බන්ධ ප්‍රකාශ තුනක් පහත දැක්වේ .

A) - ප්‍රධාන විධායක නිලධාරියා සාමාන්‍යාධිකාරීවරයාය.
B) - රජය සතු ප්‍රධානතම රාජ්‍ය ආයතනයකි.
C) - මුළු දිවයිනම ආවරණය වන පරිදි පුවත් වාර්තාකරුවන් පත් කර ඇත .

මේ අතරින් සත්‍ය විය හැක්කේ,

1) A හා B ය.
2) B හා C ය.
3) A හා C ය.
4) ප්‍රකාශ තුනම සත්‍ය වේ.

8) රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය වඩාත් සම්පව ක්‍රියා කිරීමෙන් අපට ලැබෙන ප්‍රධාන වාසිය,

1) අර්ථවත් ප්‍රධාන සංස්කෘතියන් වින්දනය කිරීමට ලැබීම.
2) මාධ්‍ය සාක්ෂරතාවය සංවර්ධනය කර ගැනීමට අවස්ථාව ලැබීම.
3) ග්‍රාහක වහල් භාවය නිශේධනය කිරීමට අවස්ථාව ලැබීම.
4) සරල විනෝදයට සමාජ යොමු කිරීමට අවස්ථාව ලැබීම.

9) ස්ත්‍රී - පුරුෂ සාමාජ භාවය රටක සංවර්ධනයට යොමු කිරීමේදී මාධ්‍යයට කළ හැකි ප්‍රධාන කාර්යයකි.

1) මාධ්‍ය ආයතන වලට හැකි තරම් කාන්තාවන් බඳවා ගැනීම.
2) පිරිමින්ගේ දෘෂ්ටි කෝණයෙන් කාන්තා රූපය රැගත් වැඩසටහන් නිර්මාණය කිරීම.
3) ගෘහස්ථ සීමාවට පමණක් යෝග්‍ය වැඩසටහන් විකාශය කිරීම.
4) ස්ත්‍රී - පුරුෂ අසමානත්වය විවේචනයට ලක් කරමින් ජන මත ගොඩ නැගීම.

10) ඡායාරූපයක් පුවත්පත් වාර්තාවන් සමග යොදා ගැනීමෙන් ලැබෙන ප්‍රධානම වාසිය,

1) ප්‍රවෘත්තියේ විශ්වාසනීයත්වය වැඩි වීම.
2) සාක්ෂරතාවය අඩු ග්‍රාහක පිරිසට ප්‍රවේශ කිරීම පහසු වීම.
3) ප්‍රවෘත්තියට විචිත්‍රවත් බවක් ලබා ගැනීමට හැකි වීම.
4) විශාල තොරතුරු ප්‍රවාහයක් එකවර සන්නිවේදනය කිරීමට හැකි වීම.

11) ප්‍රවෘත්තියක් යනු ,

1) ජනතාවගේ වැඩි අවධානයට යොමු වූ සිද්ධියකිධියකි.
2) ජනතාව දැන ගත යුතු ආරංචියකි.
3) ජනමාධ්‍ය හරහා වාර්තා වූ තොරතුරකි.
4) රාජ්‍ය නිවේදනයකි.

12) දෘෂ්ඨයේ අඛන්ඩතාවය නම් සිද්ධාන්තය නිසා ඇති වන වාසියයි.

1) රූප පෙළක් අඛන්ඩව පවත්වා ගැනිමට හැකියා ලැබීම.
2) රූප කඩින් කඩ බැලීමට අවස්ථාව ලැබීම.
3) රූප අඛන්ඩව කඩින් කඩ බැලීමට අවස්ථාව ලැබීම.
4) රූපයේ විචිත්‍ර බව වැඩි කිරීමට අවස්ථාව ලැබීම.

13) නව මාධ්‍යයේ ස්වභාවයන් පිළිබඳ 11 ශ්‍රේණියේ සිසුන් සිව් දෙනෙකු අතර ඇති වූ සංවාදයක් මෙසේය.

A) - භූගෝලීය සීමා අතික්‍රමණයක් දැකිය හැකිය.
B) - ගෝලීය වශයෙන් ව්‍යාප්තියක් දැකිය හැකිය.
C) - ඇයිතිකාරීත්වය ඉතා පැහැදිලිය.
D) - මූලික සාක්ෂරතා ඥානය අවශ්‍ය නොවන මාධ්‍ය විශේෂයකි.

මේ අතරින් **අසත්‍ය** ප්‍රකාශය ඉදිරිපත් කර ඇත්තේ.

1) A හා B පමණි.
2) A හා C පමණි.
3) C හා D පමණි.
4) B හා D පමණි.

14) රූපවාහිනී ටෙලි නාට්‍යයක් නරඹන ඔබ සම්බන්ධ වී සිටින සන්නිවේදන වර්ගය හා ස්වරූපය පිළිවෙලින් දක්වා ඇත්තේ,

1) සමූහ - ශ්‍රව්‍ය
2) ජනඃ - ලිඛිත
3) විශ්ව - විධිමත්
4) ජනඃ - දෘශ්‍ය

15) ඔබගේ ගුරුතුමිය ඉංග්‍රීසි භාෂාව හොඳින් ප්‍රගුණ කරන ලෙස නිරන්තරයෙන් උපදෙස් ලබා දේ. මෙසේ වීමට බලපාන හේතුව/හේතූන් විය හැක්කේ,

1) දැනුම සංරක්ෂණය කර ගැනීමට හැකි වීම නිසා.
3) සිතීම විධිමත් කළ හැකි වීම නිසාය.
2) සැබෑව හඳුනා ගැනීමට හැකි වීම නිසාය.
4) ඉහත සියල්ලම කළ හැකිවීම නිසාය.

16) වර්තමානයේ භාවිතා කරන මුද්‍රණ ශිල්පය හැඳින්වෙන්නේ

1) උත්තල මුද්‍රණ ක්‍රමය යනුවෙනි
2) සමතල මුද්‍රණ ක්‍රමය යනුවෙනි
3) අවතල මුද්‍රණ ක්‍රමය යනුවෙනි
4) තිර මුද්‍රණ ක්‍රමය යනුවෙනි

17) විද්‍යුත් චුම්භක රටාවන් අඩංගු කරන ලද විද්‍යුත් කාඩ් පතක් පරිහරනය කිරීමේ දී ,

1) ටෙලර් යන්ත්‍රයක් අවශ්‍යම නොවිය හැකිය.
2) රහස්‍ය අංකය මතක තබා ගැනීම වැදගත් විය හැකිය.
3) ණය පතක් ලෙස යොදාගත නොහැකිය.
4) අත්සතු කිරීම කළ හැකිය.

18) ලාභදායි පණිවිඩ ක්‍රමයකි.

1) ටෙලි මේල් යැවීම.
2) කුරියර් සේවාව මගින් ලිපි යැවීම.
3) වෙස්ටන්යූනියන් මගින් මුදල් යැවීම.
4) විද්‍යුත් තැපැල් පණිවිඩයන් යැවීම.

19) ගුවන් විදුලිය පරිභරණය කරන ශ්‍රාවකයාට අනිවාර්යයෙන්ම අවශ්‍ය සාධකය.

1) පරිකල්පන ශක්ති නම් වේ.
2) සංජානන ශක්තිය නම් වේ.
3) සාක්ෂරතාවය නම් වේ.
4) තාක්ෂණික ඥානය නම් වේ.

20) ආදි සිසු සංගමයක සභා වාරයට පැමිණෙන දහසක් වූ සමාජිකයන්ට පෙර වසරේ අය වැය වාර්තාව ලබා දීමට පහසුවෙන්ම ලාභදායි ලෙස භාවිතා කළ හැකි මාධ්‍ය උපකරණයකි.

1) ඩුප්ලෝ යන්ත්‍රය නම් වේ.
3) ඡයා පිටපත් යන්ත්‍රය නම් වේ.
3) ප්‍රින්ටරය නම් වේ.
4) ස්කෑන් යන්ත්‍රය නම් වේ.

21) පෞද්ගලික ව්‍යවසායකත්වය මාධ්‍ය සමග එක් වීමෙන් සිදු වූ ප්‍රධානම අයහපත.

1) මාධ්‍ය ජාලය පුළුල් වීමයි .
2) නව මාධ්‍ය සංස්කෘතියක් බිහිවීමයි.
3) සංස්කෘතික හරණයන් සිදුවීමයි.
4) රජය සමග ගැටුම් ඇති වීමයි.

22) වේගත් සන්නිවේදනයන් සඳහා භාවිතා කළ හැකි උපකරණයකි.

1) පෑන
2) පේජරය
3) යතුරු ලියනය
4) පිටු පෙරලනය

23) විනෝදාස්වාදක අධ්‍යාපනයේ වැදගත්කමකි.

1) ඉගෙනුම් ක්‍රියාවලිය සඵලතාවයකින් යුක්ත වීමට.
2) සිසුන්ට ගීත ඇසීමට අවස්ථාවන් හිමිවීමට.
3) සිසුන්ට ක්‍රීඩා කිරීමට අවස්ථාවන් හිමිවීමට.
4) මාධ්‍ය - ගුරු - සිසු සම්බන්ධය අභිභවා විනෝදය ඉස්මතු වීමට.

24) පුරවැසිභාවය නම් සංකල්පය වැදගත් වන සමාජය.

1) සමානාත්මතා සමාජය නම් වේ.
2) ගෝත්‍රික සමාජය නම් වේ.
3) පැසිස්ට්වාදී සමාජය නම් වේ.
4) හිපි සමාජය නම් වේ.

25) පුවත් පත් පාඨකයාට අනිවාර්යයෙන්ම අවශ්‍ය සාධකය.

1) පරිකල්පන ශක්තිය ලෙස හැඳින්වේ.
2) සංජානන ශක්තිය ලෙස හැඳින්වේ.
3) සාක්ෂරතාවය ලෙස හැඳින්වේ.
4) තාක්ෂණික ඥානය ලෙස හැඳින්වේ.

26) මෝස් සංඥා ක්‍රමයේ නිර්මාතෘ.

1) ජෝන් ලොගි බෙයාර්ඩ්ය
2) ග්‍රිෆිත්ය
3) සැමුවෙල් මෝස්ය
4) මාර්කෝනිය

27) රාජ්‍ය මාධ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ප්‍රභේද වලට පදනම් වන මූලික සාධකය ,

1) පරිපාලනයයි. 2) ග්‍රාහකත්වයයි. 3) අයිතියයි. 4) ව්‍යාප්තියයි.

28) කැමරාවකට පැවරෙන ප්‍රධාන වගකීම,

1) ලගා වූ ආලෝකය ප්‍රතිබිම්බ ගත කිරීමයි.
2) ඡායාරූපයක් ලබා ගැනීමට යන්ත්‍ර සහායකයකු ලෙස ක්‍රියා කිරීමයි.
3) ජ්‍යාමිතික හැඩතල අනුව ඡායාරූපය නිර්මානය කිරීමයි.
4) ප්‍රතිබිම්බයේ ස්ථාවරය බිඳ හෙළීමයි.

29) සංවර්ධන සංන්නිවේදනයේ දී භාවිතා කළ හැකි නිර්මානශීලි ප්‍රයෝගයකි.

1) ගු : වි : නාට්‍යය
2) ගු : වි : පුවත්විකාශ
3) ගු : වි : සාකච්ඡා
4) ගු : වි : සංගීත වැඩසටහන්

30) " සෑම උද්වේගකර ආරංචියක්ම ප්‍රවෘත්තියකි " මෙය කාගේ අර්ථ දැක්වීමක්ද?

1) පෝල් D මැකිනියර්ගේය.
2) චාල්ස් ඇන්ඩර්සන් ඩානාගේය.
3) විල්බර් ශ්‍රාම්ගේය.
4) මිල්ටන් බ්‍රෂ්ගේය.

31) ප්‍රමාණය අනුව පුවත්පත් වර්ගී කරන ප්‍රභේදයකි.

1) $A_4$ ප්‍රමාණය 2) තීරු ප්‍රමාණය 3) බ්‍රෝඩ් ශීට් ප්‍රමාණය 4) ලිගල් ප්‍රමාණය

32) රූපවාහිනිය අස්ථායි මාධ්‍යයක් වන්නේ,

1) කෙටි වේලාවක් පමනක් සන්දේශ පරිශීලනය කළ හැකි නිසාය.
2) එකම ස්ථානයේ තබා නැරඹිය නොහැකි නිසාය.
3) රූපවාහිනිය සඳා ඇති ද්‍රව්‍යයේ පරමානුක ව්‍යුහයේ අස්ථායිබව නිසාය.
4) රූපවාහිනි සජීවි මාධ්‍යයක් නිසාය.

33) " මාධ්‍යයක් " ලෙස අර්ථ දක්වා ඇත්තේ ,

1) සන්නිවේදකයා සතු අත්පිටපතයි .
2) තාක්ෂනික මැදිරියයි.
3) සන්දේශ ග්‍රහණය කර ගැනීමට භාවිතා කරන ක්‍රම වේදයයි .
4) සන්දේශ විකාශය කිරීමට භාවිතා කරන ක්‍රම වේදයයි .

34) රූපවාහිනී ප්‍රවෘත්ති
1) පුද්ගල මූලාශ්‍රයකි.
2) ආයතනික මූලාශ්‍රයකි.
3) මාධ්‍ය මූලාශ්‍රයකි.
4) ලිඛිත මූලාශ්‍රයකි.

35) මෘදු පුවත් විශේෂයකි.
1) ප්‍රධාන සිරස්තලය
2) කතුවැකිය
3) හාස්‍ය උත්පාදන පුවත්
4) දේශපාලන කෝලම

36) ඡායාරූපයක ක්ෂෙත්‍රයේ ගැඹුර ( Depthof Field ) යනු
1) කැමරා කාචයේ නාභීය දුර
2) කැමරා කාචයට හසුවන දර්ශන කෝණය.
3) කැමරාව සහ වස්තුව අතර ඇති දුර.
4) වස්තුවේ සිට ඉදිරියට හා පසු පසට නාභිගත වන දුර.

37) A + B +C = C මෙය පෝල් ඩී මැසිනියර්ගේ විශ්වාසත්වය පිළිබඳ සූත්‍රයයි. මෙහි (A) යනු ?
1) සමතුලිත බවය
2) පැහැදිලි බවය
3) නිවැරදි බවය
4) විශ්වාසවන්ත බවය

38) වාරය අනුව පළ කරන පුවත් පත් විශේෂයකි.
1) දෙසති පුවත් පත්
2) කාන්තා පුවත් පත්
3) ටැබ්ලොයිඩ් පුවත්පත්
4) විශේෂාංග පුවත් පත්

39) විචාරශීලි ග්‍රාහකයා වනුයේ .
1) අක්‍රිය ග්‍රාහකයාය
2) සක්‍රිය ග්‍රාහකයාය
3) උදාසීන ග්‍රාහකයාය
4)අභව්‍ය ග්‍රාහකයාය

40) කමල් රජයේ කාර්යාලයක විධායක නිලධාරියෙකි. පසු දින සේවකයන්ට ලබා දිය යුතු වැඩ කොටස් පිළිබඳ ස්මරණය කරමින් ලේඛනයක් පිළියෙල කළේය. කමල් සම්බන්ධ වී සිටින සන්නිවේදන වර්ගය හා ස්වරූපය අනුපිළිවෙලින් දක්වා ඇත්තේ,
1) අන්තර් පුද්ගල - වාචික සන්නිවේදනය
2) අන්තර්වර්ති පුද්ගල - ලිඛිත සන්නිවේදනය
3) සමූහ සන්නිවේදනය - ශ්‍රවක සන්නිවේදනය
4) විශ්ව සන්නිවේදනය - දෘශ්‍ය සන්නිවේදනය

( ල : 40 X 1 )

## B - කොටස ( රචනා )

- පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න **හතරක්** තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1) කෙටි පිළිතුරු සපයන්න.**

I. අන්තර්ජාලයත් අයත් වන සන්නිවේදන ස්වරූපය නම් කරන්න.

II. ලැස්වෙල්ගේ සන්නිවේදනය පිළිබඳ අර්ථ දැක්වීම ලියා දක්වන්න.

III. සැපුම් හා සැලසුම් උපකරණ වල වැදගත්කමක් ලියන්න.

IV. මාධ්‍යවේදියා ග්‍රාහකයාට බලපාන ආකාරය කෙටියෙන් පහදන්න.

V. වැඩ ලෝකය සඳහා සන්නිවේදනයේ අවශ්‍යතාවක් දක්වන්න.

VI. අභිසාර මාධ්‍ය කලාවේ විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

VII. පුද්ගලයෙකුට තොරතුරු අවශ්‍ය වන්නේ මන්ද? කරුණු දෙකක් ඇසුරෙන් පෙන්වා දෙන්න.

VIII. සමාජයට තොරතුරු ලැබෙන මූලාශ්‍ර දෙකක් නම් කරන්න.

IX. 1978 ව්‍යවස්ථාවෙන් ප්‍රකාශන නිදහස සීමා කර ඇති වගන්තියක් සඳහන් කරන්න.(අංක දැක්වීම අනිවාර්යය වේ.)

X. චන්ද්‍රිකා රූපවාහිනී තාක්ෂණය සතු ලක්ෂණයක් සහ වැදගත්කමක් වෙන වෙනම ලියා දක්වන්න.

**2)** ෂැනොන් - විවර් සන්නිවේදනය පිළිබඳ සරල සූත්‍රයක් හඳුන්වා දුන් අතර , ලැස්වෙල් ප්‍රථම විද්‍යාත්මක අර්ථ දැක්වීම ඉදිරිපත් කරන ලදි. සන්නිවේදනය තුළින් විවිධ අරමුණු මානවයා ඉෂ්ට කර ගනී.

I ලැස්වෙල්ගේ අර්ථ දැක්වීමේ අන්තර්ගත මූලිකාංග දෙකක් නම් කරන්න. ( ල : 01 )

II. සන්නිවේදන අරමුණු දෙකක් පිළිබඳ කෙටි විස්තරයක් සඳහන් කරන්න. ( ල : 02 )

III. ෂැනොන් - විවර් ආකෘතිය රූපයකින් දක්වා ,එහි අංග ක්‍රියාත්මක වන ආකාරය පෙන්වා දෙන්න.( ල : 03 )

IV. ද්විමාර්ගික සන්නිවේදන සූත්‍රය පිළිබඳ රූප සටහන් සහිතව කෙටි විස්තරයක් සපයන්න. ( ල : 04 )

**3)** වචන භාවිතා කරමින් සිදු කරන සන්නිවේදනය වාචික සන්නිවේදනයයි. එය භාවිතා කරන විට සන්නිවේදනයේ දී විවිධ සන්නිවේදන බාධා මතු වේ.

I. වාචික සන්නිවේදනය සඳහා මානවයා භාවිතා කරන ප්‍රධාන මෙවලම නම් කරන්න. ( ල : 01 )

II. ඉහත ( I ) හි ඔබ දැක්වූ මෙවලමේ කාර්යයන් **දෙකක්** විස්තර කරන්න.( ල : 02 )

III. දක්ෂ කථිකයකු සතු විය යුතු වාචික සන්නිවේදන නිපුණතා **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. ( ල : 03 )

IV. වාචික සන්නිවේදනයේ දී ග්‍රාහකයා මුහුණ දෙන බාධක දෙකක් සඳහන් කර ඊට යෝග්‍ය පිළියම් දෙකක්ද සඳහන් කරන්න. ( ල : 04 )

4) පරිගණක මුද්‍රණ ශිල්පියාට ඉතා අවැසි ක්‍රියාවලියක් ලෙස DTP ක්‍රියාවලිය යන්න දැක්විය හැක.

I. DTP ක්‍රියාවලියේ පියවර සටහන දක්වන්න. ( ල : 01 )

II. DTP ක්‍රියාවලියේ විශේෂතා දෙකක් පෙන්වා දෙන්න. ( ල : 02 )

III. ඩිජිටල් ප්‍රින්ටරය - ලැමිනේටින් යන්ත්‍රය - බැඳුම් යන්ත්‍රයේ තිබෙන වැදගත්කම් එක බැගින් ලියා දක්වන්න. ( ල : 03 )

IV. පරිගණක උපකරණ භාවිතයේ අවශ්‍යතා හතරක් විස්තර කරන්න. ( ල : 04 )

---

5) පංති කාමරයේ ඉගැන්වීම වඩාත් ආකර්ෂණය කර ගැනීමට තාක්ෂණය යෝග්‍ය අයුරින් භාවිතා කළ හැක.

I. පංති කාමර මාධ්‍ය ක්‍රියාවලිය සැලසුම් කර ගැනීමේ දී සැලකිය යුතු සාධක දෙකක් නම් කරන්න. ( ල : 01 )

II. පංති කාමර උපකරණයක් වුවත් මෙහෙය වීම සංකීර්ණ වේ. මෙහිදී අනුගමනය කළ යුතු පියවර තුනක් විස්තර කරන්න. ( ල : 02 )

III. ප්‍රක්ෂේපණ හා ප්‍රක්ෂේපණ නොවන පංතිකාමර මාධ්‍ය උපකරණ තුනක ක්‍රියාව විස්තර කරන්න. ( ල : 03 )

IV. පංති කාමර මාධ්‍ය උපකරණ වලින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට ලැබෙන වාසි හතරක් සාකච්ඡා කරන්න. ( ල : 04 )

---

6) I. " තොරතුරු " යන්න අර්ථ දක්වන්න ( ල : 01 )

II. තොරතුරු ප්‍රභේද කරන ආකාර දෙකක් විස්තර කරන්න. ( ල : 02 )

III. ලෝකයේ බ්‍රෝඩ් ෂීට් පුවත්පතට වඩා ටැබ්ලොයිඩ් පුවත් පත වෙනස් වන ආකාර තුනක් කෙටියෙන් සඳහන් කරන්න ( ල : 03 )

IV. සිනමාව හා රූපවාහිනිය අතර මූලික වෙනස්කම් හතරක් සංසන්දනය කරන්න. ( ල : 04 )

---

7) ජන මාධ්‍ය වලට වර්තමානයේ විශාල ග්‍රාහක පිරිසක් සවන් දෙනු ඇත.

I. ප්‍රධාන ග්‍රාහක වර්ග තුන නම් කරන්න. ( ල : 01 )

II. මාධ්‍ය නිර්මාණ ග්‍රාහකයාට බලපා ඇති ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් පෙන්වා දෙන්න. ( ල : 02 )

III. මාධ්‍ය හා ග්‍රාහක බලපෑම් ප්‍රතිචාර (දෙපසටම) වන ආකාරය වෙන වෙනම පෙන්වා දෙන්න. ( ල : 03 )

IV. ග්‍රාහකයාට රස විඳීමට ඇති පිරිමාණ යන ප්‍රධාන ලක්ෂණ හතරක් විස්තර කරන්න. ( ල : 04 )

---



සැකසුම :- සම්පත් නානායක්කාර
මාර / ජනාධිපති විද්‍යාලය
මහර
( 071 - 8274251 )